# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2407/02 - 2024 ඔක්තෝබර් මස 22 වැනි අඟහරුවාදා - 2024.10.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම - සංශෝධන අංක 06

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2014 අගෝස්තු මස 28 වැනි දිනැති අංක 1877/27 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ඩබ්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2024 ඔක්තෝබර් මස 22 වැනි දින.

I කොටස

සංශෝධන අංක 01 - 2015 ජූලි මස 29 වැනි දින හා අංක 1925/59 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 02 - 2016 දෙසැම්බර් මස 06 වැනි දින හා අංක 1996/25 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 03 - 2018 අගෝස්තු මස 03 වැනි දින හා අංක 2082/59 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 04 - 2019 අගෝස්තු මස 23 වැනි දින හා අංක 2137/89 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 05 - 2021 ජූනි මස 22 වැනි දින හා අංක 2233/19 *අති විශෙෂ ගැසට් පත්‍රය*


1A - G 42948 — 05 (2024/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

II කොටස

7.2.2.1 (ඇ) වගන්තියට පසුව පහත සටහන ඇතුළත් කරනු ලැබේ.

*සටහන :*
සේවයේ අනුමත තනතුරු සඳහා බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් යටතේ සලකා බැලෙන උපාධි පාඨමාලා පිළිබඳව එම තනතුරුවලට අදාළ අනුමත බඳවා ගැනීමේ පටිපාටිවල ඇතුළත් විය යුතුය. තවද, එක් එක් තනතුරට අදාළ බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් හා උපාධි පාඨමාලා පිළිබඳව එම තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ද සඳහන් කෙරෙනු ඇත. යම් තනතුරකට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සමඟ සැසඳෙන ආකාරයෙන් එකී තනතුරට අදාළ අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ ඇතුළත් අධ්‍යාපන සුදුසුකම් යාවත්කාලීන වී නොමැති අවස්ථාවක අයැදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන අධ්‍යාපන සුදුසුකම් අදාළ තනතුර සඳහා බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් ලෙස සැලකිය යුතුය.

7.2.4.1 ලිඛිත විභාගය යටතේ වන කරුණ වෙනුවට පහත පරිදි ආදේශ කරනු ලැබේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු සංඛ්‍යාව* | *සමත් ලකුණු සංඛ්‍යාව* |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| පොදු ප්‍රශ්න පත්‍රය | 100 | 40 |

(ලිඛිත විභාගය සඳහා ඇතුළත් විෂය නිර්දේශ 02 වැනි පරිශිෂ්ටයේ සඳහන් වේ.)

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් යටතේ වන කරුණ වෙනුවට පහත පරිදි ආදේශ කරනු ලැබේ.

සේවයේ අනුමත තනතුරු සඳහා බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් යටතේ සලකා බැලෙන උපාධි පාඨමාලා පිළිබඳව එම තනතුරුවලට අදාළ අනුමත බඳවා ගැනීමේ පටිපාටිවල ඇතුළත් විය යුතුය. තවද, එක් එක් තනතුරට අදාළ බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් හා උපාධි පාඨමාලා පිළිබඳව එම තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ද සඳහන් කෙරෙනු ඇත. යම් තනතුරකට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සමඟ සැසඳෙන ආකාරයෙන් එකී තනතුරට අදාළ අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ ඇතුළත් අධ්‍යාපන සුදුසුකම් යාවත්කාලීන වී නොමැති අවස්ථාවක අයැදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන අධ්‍යාපන සුදුසුකම් අදාළ තනතුර සඳහා බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් ලෙස සැලකිය යුතුය.

02 වැනි පරිශිෂ්ටය යටතේ වන කරුණු වෙනුවට පහත සඳහන් පරිදි ආදේශ කරනු ලැබේ.

02 වැනි පරිශිෂ්ටය
විවෘත තරඟ විභාගය සඳහා ඇතුළත් විෂය නිර්දේශය

01. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 1 - ලකුණු 100 යි.
අපේක්ෂකයාගේ තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය සහ තීරණ ගැනීමෙ හැකියාව වැනි කරුණු නිශ්චය කිරීම සඳහා සකස් කරනු ලබන මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත වනු ඇත.

02. පොදු ප්‍රශ්න පත්‍රය - කාලය පැය 3 - ලකුණු 100 යි.
ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද, ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු ද, ජාතික හා ජාත්‍යන්තර විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ඇති අවබෝධය ද පරීක්ෂා කිරීම සඳහා සකස් වූ සාමාන්‍ය දැනුම මැන බලන ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න පත්‍රය කොටස් 2 කි. පළමු කොටස කෙටි ප්‍රශ්නවලින් සමන්විතය. ලකුණු 25 කි. දෙවන කොටස අර්ධ ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විතය. ප්‍රශ්න 8 කින් 5 කට පිළිතුරු සැපයිය යුතුය. ලකුණු 75කි.

EOG 10 - 0194

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.